07-ශ්‍රේණිය.

සිංහල

16-පාඩම. සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර. (තනි පද)

(01.) පාඩම හොඳින් අවබෝධයෙන් යුතුව කියවන්න.

(02.) "සුර රද සමන් සමඟින් සුරඟන එවර.........." යන සැලළිහිණි සංදේශයේ එන කවිය තාලයට ගායනා කරන්න.

(03.) මෙම කවියෙහි අර්ථය අවබෝධ කරගන්න.

(04.) පාඩමේ සඳහන් "බුද්ධං සරණේ සිරස දරාගෙන ..........." යන කවිය ඇතුළත් තුන්සරණේ කවි හොඳින් ශබ්දනගා ගායනා කරන්න.

(05.) සමනොළ කන්ද තේමා කරගෙන නිර්මාණයවී ඇති ගීත තුනක්වත් එකතු කර, ගායනා කරන්න.

(06.) පෙළ පොතේ දක්වා ඇති හිස්තැන් පිරවීම (පිටුව-134) සහ සමාන අර්ථය දෙන පද (පිටුව-135) යන අභ්‍යාස කරන්න.

(07.) තනි පද යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

(08.) පාඩම් පොතේ ඇති තනිපද සහිත වාක්‍ය සොයන්න. පොතේ 135 සහ 136 යන පිටුවල නිදසුන් හොඳින් පරිශීනය කරන්න.

(09.) පොතේ 136 සහ 137 පිටුවල ඇති 1. 2. යන අභ්‍යාස කරන්න.

(10.) ඔබට කැමති තනි පද දහයක් ලියා එයින් කියවෙන දෙය විස්තර කර දක්වන්න.

07-ශ්‍රේණිය.

සිංහල

17- පාඩම.        සුදන ගුණ.

(01.) පෙළ පොතේ සඳහන් පාඩම පිළිබඳ හැඳින්වීම හොඳින් කියවන්න.

(02.) උපදේශ කාව්‍ය යනු මොනවාදැයි අවබෝධ කරගන්න.

(03.) උපදේශ කවි පහක් සොයාගෙන ගායනා කර, ඒවායෙහි අර්ථ වටහා ගැනීමට උත්සාහ ගන්න.

(04.) පාඩමේ සඳහන් තිරුක්කුරල් කවි හොඳින් කියවා අර්ථ අවබෝධ කරගන්න.

(05.) පාඩමේ සඳහන් ලෝකෝපකාරයේ කවි හොඳින් කියවා අර්ථ අවබෝධ කරගන්න.

(06.) පොතේ 141 පිටුවෙහි අවබෝධය යටතේ ඇති ප්‍රශ්න හතරට පිළිතුරු සොයන්න.

(07.) පෙළ පොතේ 142 පිටුවෙහි ඇති ප්‍රශ්න පහ පිටපත් කරගෙන පිළිතුරු සපයන්න.

(08.) ඔබ දන්නා උපදේශ කථාවක් ලියා එයින් ගත හැකි උපදේශ ලියන්න.

07-ශ්‍රේණිය.

සිංහල

18-පාඩම. මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා.

(01.) මෙම පාඩමේ හැඳින්වීම හොඳින් කියවා අවබෝධ කර ගන්න. දේශාභිමානය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

(02.) කරුණාරත්න අමරසිංහ වැනි ගුවන් විදුලි නිර්මාණ කරුවන් කීපදෙනෙකු පිළිබඳ තොරතුරු එකතුවක් සකස් කරන්න.

(03.) කාව්‍යෝක්ති යනු කුමක්දැයි තොරතුරු සොයා අවබෝධ කරගෙන, ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(04.) අවබෝධය යටතේ 144 පිටුවෙහි ඇති ප්‍රශ්න පහට පිළිතුරු සපයන්න.

(05.) ප්‍රායෝගික අභ්‍යාස ලෙස 145 පිටුවෙහි දක්වා ඇති 1,2,3 සහ 5 යන අභ්‍යාස කරන්න.

(06.) පාඩමේ සඳහන් සහ ඔබ කැමති වෙනත් දේශාභිමානී ගී ගායනා කරන්න, රස විඳින්න.